# බයිසිකලය



විහිනි ලිතාසා තිහගොඩ
(කර්තෘ)

# බයිසිකලය

කර්තෘ : විහිනි ලිතාසා තිහගොඩ

ISBN 978-624-208-012-3

පළමු පිටපත සහ මුද්‍රණය

2023 ඔක්තෝම්බර් 20

කතාව සහ චිත්‍ර

විහිනි ලිතාසා තිහගොඩ
4 වසර B
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර

# පිදුම

මාගේ ආදරණීය අම්මාටත්,

අප්පච්චීටත්, මා දිරිමත් කරනා

සමන්මලී ගුරුතුමියටත්

ඉතා සෙනෙහසින් පුදමි.

# ස්තූතිය

**මෙම පොත ලිවීමට**

**මට උදව් කල හැම දෙනාට ම**

**ස්තූතියි.**

විහිනි

පෙරවදන


වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් ''දිවිය දිනන විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමී.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක්වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පති වරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කල සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.11.01




# බයිසිකලය

කමල්ට කොළ පැහැති ගසක් කලාතුරකින්වත් දැකීමට
නොමැති තරමට බැලූ බැලූ තැන වියළීගිය
ගහ කොළ පමණක් නොව මුළු ඇඟම
පිච්චී යන්නට තරම්ය.




ඉඳ හිට එකවර ම හමා යන සුළං රැල්ලෙන්
නැගෙන දුහුවිල්ලෙන් අප වසාලන්නේ වැස්ස ළඟ
පාතකවත් නැති බව මතක් කර දෙන්නට මෙනි.
සෙරෙප්පු දෙකක් දමාගෙන සිටිය ද
වැලි වල රස්නය කමල්ගේ කකුල් වලට
හොඳට ම දැනේ.




කමල් ඔහුට ඉදිරියෙන් කෙසෙල් කැනකුත් කර තබාගෙන යන තාත්තා දෙස බැලුවේය. කමිසයකුත් නැතිව කෙසෙල් කැන කර තබාගෙන තවත් මල්ලක් අතින් එල්ලගෙන යන ඔහුට මහන්සි බව කමල්ට පෙනේ.

පලා මිටි පිරෙවූ බෑගය ද රැගෙන කමල් සමඟ තාත්තා මේ යන්නේ හංදියේ වූ ඉරිදා පොළ වෙතයි. මේ වන විට වැස්ස නොමැතිව මාස තුන කට වැඩිය.



නියඟය සමඟ සටන් කරමින් හදාගත් එළවළු ටික
ඔවුන්ට විකුණන්නට වී ඇත්තේ
අඩු මිලකට ය.
තරමක් විශාල ඉඩමේ එළවළු වර්ග
කිහිපයක් ද පලා වර්ග ද කෙසෙල් ගස් ද වගා කළ
ඇති අතර මහන්සි වී වැඩ කරන තාත්තාට
කමල්ද හැකි පමණින් උදව් කරන ලදී.
සෑම විට ම අම්මා පවසන්නේ සෑම දිනකම පාසල්
ගොස් හොඳට ඉගෙන ගන්නා ලෙසය. කමල් මේ
වසරේ ශිෂ්‍යත්වේ විභාගය ලියන බැවින් පාසල්
ගොස් පැමිණ ගොවිපොළට ගොස් තාත්තාට ද
උදව් කර පාඩම් වැඩ නිම කොට නින්දට යන්නේය.

හිම්දිරි උදෑසන අවදි වී අම්මා සාදා දෙන
තේ කෝප්පය සමඟ පාන් කෑල්ලක් කා
කමල් නංගී ද සමඟ පාසල් යාමට සූදානම් වෙයි.
නිවසේ සිට පාසලට කිලෝමීටර තුන හතරක් පයින්
ඇවිද යා යුතුය.
කකුල් රිදෙන විට දී අපිටත් බයිසිකලයක්
තිබෙනවා නම් හොඳයි කියා මොවුන්ට සිතෙන
අවස්ථා බොහෝමය.



කමල් පංති කාමරය පිරිසිදු කිරීමට සිටිය ද කිසිම දිනයක එය ඉටු කිරීමට නොහැකි වන්නේ පාසල ආරම්භ වී තිබෙන නිසාය.

පංතියේ ළමයින්ගේ උසුළු විසුළු ඔහු දැන් ගණන් නොගනී කමල් පංතියට යන විටත් පංතිභාර ගුරුතුමිය පංතියට පැමිණ සිටි අතර ළමුන් කිහිප දෙනෙක් ඇය වට කර ගෙන බදාගෙන සිටියහ.

ඔහු පැමිණීමට ප්‍රමාද වීමට හේතු විමසන ලදී.

වෙනදා මෙන් ඇය කමල්ට බැණ  වැදුනේ නැත.

ඊට හේතුව පසුගිය වාර පරීක්ෂණයේ වෙනදාට වඩා ලකුණු වැඩිපුර ලබා ගත් නිසාය.

කාලය මෙසේ ගෙවී ගිය අතර පාඩම් වැඩ උනන්දුවෙන් කරන නිසා ගුරුතුමිය වෙනදාට වඩා කමල් පිළිබඳව උනන්දුවක් දක්වන්නට විය.


එක් උදෑසනක ගුරුතුමිය හමු වීමට එන ලෙස දැන්වූ අතර කමල් එහි ගිය පසු ඇය කමල් හට බයිසිකලයක් ලබා දුන්නාය. එදින කමල්ට ඉහේ මලක් පිපුණා මෙන් සතුටක් දැනුනි.

කමල් බයිසිකලය ද රැගෙන කුරුල්ලෙකු මෙන් නිවසට ගියේය.

බයිසිකලය දැක තාත්තාත්, අම්මාත්, නංගීත්, සතුටු වූහ.

එය ලබා දුන් ගුරුතුමියට ස්තූති කිරීමට අමතක නොකළෝය.





පසු දින සිට තාත්තා, නංගී සහ කමල්
බයිසිකලයෙන් පාසල වෙත ඇරලවන නිසා
වේලපහින් ම පාසලට ගොස් පිරිසිදු කිරීමේ
කටයුතු වලට ද සහය දිය හැකිය. වෙනදා මෙන්
යහළුවන්
උසුළු විසුළු කරන්නේ ද නැත.
තාත්තා වෙනදා මෙන් පොළට කර මතින් බඩු
රැගෙන යාමට අවශ්‍ය නැත.

අග හිඟ කම් මැද කමල් ශිෂ්‍යත්ව

විභාගය ද සමත් විය.

ඒදින වැඩිපුර ම සතුටු වූයේ පංතිභාර

ගුරුතුමියයි.

පවුලේ ආර්ථිකය ද යම් මට්ටමකට ශක්තිමත් වී

තිබුණි. තාත්තාගේ මහන්සියත් අම්මාගේ

කැපකිරීමත් ගුරුතුමියගේ මග පෙන්වීමත් නිසා

තිබූ බලාපාරොත්තු ඉටුවිය.

කමල්ට ඉතා සතුටක් දැනෙන්නට විය.

පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදු වන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසැල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත් කතුවරියන් ය. පාසල තුළ ගොඩනැඟී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නටය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත්කෘති දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත් කතු අංකුර ඔබට ලෝකයේ දිනන ගත් කතුවරයෙක් වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහ ලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023/11/01